## වාාපාර අධාායනය – 3 – රජය හා වාාපාර

1.වාාපාර කෙරෙහි රාජා බලපෑම් ඇති කරන ප්‍රධාන ආකාර නිවැරදිව දැක්වෙන ආකාරය වන්නේ,

1.මධාාම රජය,පළාත් සභා,ප්‍රාදේශීය සභා
2.මධාාම රජය,නගර සභා,පළාත් පාලන ආයතන
3. මධාාම රජය,පළාත් සභා, පළාත් පාලන ආයතන
4. මධාාම රජය,පළාත් සභා,මහ නගර සභා
5.මධාාම රජය,මහ නගර සභා,ප්‍රාදේශීය සභා

2.ආර්ථිකයක අරමුණ හා වාාපාර අරමුණ ඉටු කිරීමට දායක වන අයුරු පහත දැක්වේ.

1.පූර්ණ සේවා නියුක්තිය
2.ආර්ථික ස්ථායීතාව
3.බදු ගෙවීම
4.සාධාරණ ආදායම් වාාප්තිය
5.දේශීය සම්පත් භාවිතය

මේ අතුරින් ආර්ථිකයක අරමුණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1.)1,2,5
2.)1,2,4
3.)2,4,5
4.)3,4,5
5.)1,2,3

3.පහත දැක්වෙන්නේ රජය වාාපාරවලට බලපෑම් කරන ආකාර කිහිපයකි.

A - යටිතල පහසුකම් සැපයීම.
B - තරඟකරුවෙකු වීම.
C - ප්‍රතිපත්ති සම්පාදකයෙකු වීම.
D - බදු අයකරන්නෙකු වීම.

මේ අතුරින් පෞද්ගලික අංශයට හිතකර බලපෑම් ඇති වේ යැයි අපේක්ෂිත පිළිතුර වන්නේ,

1. A හා B
2. C පමණි.
3. A පමණි.
4. A හා C
5. B හා C

4.ආර්ථික අරමුණු ඉටු කර ගැනීමේදී දේශීය හා විදේශීය වශයෙන් අර්බුද ඇති නොවී කටයුතු කිරීමේ හැකියාව,

1.අභ්‍යන්තර මිල ස්ථායීතාවයයි.
2.බාහිර මිල ස්ථායීතාවයයි.
3.යහපත් අන්තර්ජාතික වෙළෙඳාමයි.
4.ආර්ථික ස්ථායීතාවයයි.
5.විදේශ විනිමය ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාමයි.

5. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ පිස්කල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා උපකරණ කිහිපයක් පහත වේ.ඒවා අතුරින් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා උපකරණ කාණ්ඩය වන්නේ,

A - පොලී අනුපාතික නියම කිරීම.
B - රාජ්‍ය සේවා වැටුප් ඉහළ නැංවීම.
C - ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නියම කිරීම.
D - පුද්ගල හා ව්‍යාපාර මත බදු සීමාව ඉහළ දැමීම.
E - ශිෂ්ඨ ප්‍රයෝග

1.)ABC
2.) CDE
3.)ACE
4.)BCD
5.)BDE

6.පහත දැක්වෙන්නේ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බදු වර්ග කිහිපයකි.

A - වැට් (VAT) එකතු කළ අගය මත බදු
B - රඳවා ගැනීමේ බදු
C - රේගු බදු
D - නිෂ්පාදන බදු
E - ආදායම් බදු
F - සමාගම් බදු

ඉහත බදු ඍජු බදු හා වක්‍ර බදු ලෙස පිළිවෙලින් වර්ග කළ විට ලැබෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

1.)ABC/DEF
2.)ABD/CEF

3.)ADE/BCF
4.)BEF/ACD
5.)DEF/ABC

7.පහත වගුවෙන් දැක්වෙන්නේ අප රටෙහි බදු අය කරන ආයතන හා එම ආයතන මගින් අය කරනු ලබන බදු වර්ගයන්ය.

| ආයතනය | බදු වර්ගය |
|---|---|
| 1.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | A - තීරු බදු |
| 2.ශ්‍රී ලංකා රේගුව | B - පැවරුම් බදු |
| 3.සුරා බදු දෙපාර්තමේන්තුව | C - එකතු කළ අගය මත බදු |
| 4.පළාත් සභාව | D - නිෂ්පාදන බදු |
| 5.මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව | E - පිරිවැටුම් බදු |

එක් එක් ආයතනය මගින් අය කරන බදු වර්ග නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

1.)1 – B , 2 – C , 3 – D ,4 - E ,5 – A
2.) 1 – C , 2 – A , 3 – D ,4 - B ,5 – E
3.)1 – C , 2 – A , 3 – D ,4 - E ,5 – B
4.)1 – C , 2 – E , 3 – D ,4 - A ,5 – B
5.)1 – B , 2 – E , 3 – D ,4 - A ,5 – C

8. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණකි,

1.භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරීත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.
2.පාරිභෝගික සංවිධාන පිහිටුවීම,ප්‍රවර්ධනය,උපකාර කිරීම හා උනන්දු කිරීම.
3.වෙළෙඳපොල හා පාරිභෝගික කටයුතු පිළිබඳ තොරතුරු වෙනත් ආයතන සමඟ හුවමාරු කර ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.
4.පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාරිභෝගික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
5.අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයා ආරක්ෂා කිරීම.

9.ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සපයන සේවාවක් නොවන්නේ,

1.පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
2.තත්ත්ව කළමනාකරණය පුහුණුව
3.මිනුම් උපකරණ ක්‍රමාංකනය
4.භාණ්ඩ සඳහා පූර්ව අපනයන පරීක්ෂාව
5.පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම.

10.පාරිභෝගික ආරක්ෂණය තහවුරු කළ හැකි ක්‍රමයක් වන්නේ,

1.රජයේ අණපනත් මගින්
2.ව්‍යාපාර ආචාරධර්ම මගින්
3.පාරිභෝගික උපදේශනය මගින්
4.ප්‍රමිත ලාංඡන හා ලේබල් මගින්
5.ඉහත සියල්ලම මගින්

<u>පිළිතුරු</u>

| | |
|---|---|
| 1.) 3 | 6.) 4 |
| 2.) 2 | 7.)3 |
| 3.) 3 | 8.)5 |
| 4.) 4 | 9.)1 |
| 5.) 2 | 10.)5 |

**සකස් කළේ -**

**බී.ආර්.එන්.බස්නායක මිය,**
**ර/ධර්මාලෝක නවෝදයා විද්‍යාලය.**